යොමු අංකය : ව/පස/2/34(1).

## වයඹ පළාත් සභාව

## වයඹ පළාතේ පළාත් සභාවේ 1991 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 1991.02.14 වැනි දින සම්මත කරන ලදුව 1991.03.18 වැනි දින ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළුදෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

සම්පත් එම්. දසනායක,
ලේකම්,
වයඹ පළාත් සභාව.

1992 මැයි මස 26 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

### වයඹ පළාතේ පළාත් සභාවේ 1991 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

*වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 8 දරන මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි.*

මේ ප්‍රඥප්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද සංශෝධිත වූ පරිදි වූ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ සහ සංශෝධිත පරිදි වූ 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ ඇතැම් විධිවිධානවලට අනුකූලවේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 1991 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1990 අංක 8 දරන මුදල් ප්‍රඥප්තියේ II වන වගන්තියේ "මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා ගෙවීම් පැහැරහැරියකු ලෙස සලකනු ලැබිය යුතුය" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන සහ ඡේදයන් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– — 1990 අංක 8 දරන මුදල් ප්‍රඥප්තියේ II වැනි වගන්තිය සංශෝධනය කිරීම.

"මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා ගෙවීම පැහැරහරින්නකු ලෙස සලකනු ලැබිය යුතුය.

එසේ වුවද, කලින් කාර්තුවක් සඳහා වූ යම් ව්‍යාපාරයක පිරිවැටුම රුපියල් දශලක්ෂය ඉක්මවන අවස්ථාවක පසුව එළඹෙන කාර්තුව සඳහා ගෙවිය යුතු වන පිරිවැටුම් බද්ද පහත දැක්වෙන ආකාරයට ගෙවනු ලැබිය යුතුය :–

(අ) කලින් කාර්තුව සඳහා ගෙවිය යුතු වන පිරිවැටුම් බද්දෙන් තුනෙන් එකක් පසුව එළඹෙන කාර්තුවේ දෙවැනි මාසයේ පහළොස්වන දින පසු නොවී ගෙවනු ලැබිය යුතුය;

(ආ) කලින් කාර්තුව සඳහා ගෙවිය යුතු වන පිරිවැටුම් බද්දෙන් තුනෙන් එකක් පසුව එළඹෙන කාර්තුවේ තුන් වැනි මාසයේ පහළොස්වන දින හෝ ඊට පෙර ගෙවනු ලැබිය යුතුය;

(ඇ) පසුව එළඹෙන කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්ද එයින් (අ) උප වගන්තිය හා (ආ) උප වගන්තිය යටතේ ගෙවන ලද මුදල් අඩු කිරීමෙන් පසු එම කාර්තුව අවසානයේ එළඹෙන මාසයේ පහළොස්වන දින පසු නොවී ගෙවනු ලැබිය යුතුය.

එසේ නොගෙවන ලද යම් බද්දක් ගෙවීම පැහැරහරින ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද ගෙවනු ලැබිය යුත්තේ යම් තැනැත්තෙකු විසින් ද ඒ තැනැත්තා හෝ ඒ බද්ද එක් තැනැත්තකුට වැඩි දෙනෙකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතුව ඇති අවස්ථාවක, ඒ තැනැත්තාගෙන් එක් එක් තැනැත්තා සහ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතුය."

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වැනි වගන්තියේ (අ) උප වගන්තියෙහි "විකිණීමකට" යන වචනය වෙනුවට "පැවරීමකට" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ "විකිණීමකට" යන වචනය වෙනුවට "පැවරීමකට" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 48(3) වැනි උප වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන උප වගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– — ප්‍රධාන ප්‍රඥප්තියේ 48(4) අරත් උප වගන්තිය ඇතුළත් කිරීම.

"(4) යම් නිශ්චල දේපලක් හෝ මෝටර් රථයක් හෝ එවැනි දේපලක් පැවරීම සඳහා වූ මෙම වගන්තියේ (1), (2) හා (3) උප වගන්තිවල සඳහන් යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වූ විට "වටිනාකම" යන වචනයෙන් තක්සේරුකරුවකුගේ අදහස පරිදි එවැනි සාධන පත්‍රයක් ලියා අත්සන් කරන දිනයේ දී එම දේපල සඳහා විවෘත වෙළඳ පොළේ දී ලබාගත හැකි මිළ අදහස් කෙරේ."

ප්‍රධාන ප්‍රඥප්තියේ 77(1) ඇ අරත් උප වගන්තිය ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 77(1) ආ වැනි වගන්තියට ඉක්බිතිව පහත දක්වෙන උප වගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(ඇ) 40 වැනි වගන්තියේ සඳහන් යම් කරුණක් හෝ මේ ප්‍රඥප්තියෙන් නියම කළ හැකි යයි සඳහන් වන යම් කරුණක්".

ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වැනි වගන්තියේ 2 වැනි උප වගන්තියේ "එක් මාසයක්" යන වචනය වෙනුවට "තුන් මසක්" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 102 (6) අරත් උප වගන්තිය ඇතුළත් කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 102 (5) වැනි උප වගන්තියට ඉක්බිතිවම පහත දක්වෙන උප වගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(6) (අ) 102 (2) උප වගන්තිය යටතේ රහස්‍යභාව පිළිබඳ දිවුරුම්දීමට නියමිත තැනැත්තකුව සිටියදී එම දිවුරුම නොදී මේ ප්‍රඥප්තිය යටතේ කටයුතු කරන්නා වූ; හෝ

(ආ) 102 (1) වැනි උප වගන්තියේ විධිවිධාන කඩකරමින් කටයුතු කරන්නාවූ; හෝ

(ඇ) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලින් කිසිවක් කඩකරමින් කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ, අනුබල දෙන්නාවූ හෝ වෙනත් යම් තැනැත්තකු පොලඹවන්නා වූ හෝ

සෑම තැනැත්තකුම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වියයුතු අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වගන්තිය ඉවත්කොට අරත් වගන්තිය ආදේශ කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වැනි වගන්තිය ඉවත් කොට පහත සඳහන් අළුත් වගන්තිය ආදේශ කිරීමෙන් මෙසේ සංශෝධනය කරනු ලැබේ :-

"103. මේ ප්‍රඥප්තියේ කාර්යය සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා භාවිතා කළයුතු ආකෘති සහ ගණුදෙනු ලේඛන කොමසාරිස්වරයා විසින් කලින් කල නියමය කළ හැකිය. එසේ නියමය කරනු ලැබූ යම් ආකෘති හෝ ගණුදෙනු ලේඛනය කලින් කල සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ එසේ නියමය කරනු ලැබූ යම් ආකෘති හෝ ගණුදෙනු ලේඛනය වෙනුවට වෙනත් යම් ආකෘති හෝ ගණුදෙනු ලේඛනයක් ආදේශ කිරීම කොමසාරිස්වරයා විසින් කළ හැකිය."

මෙම ප්‍රඥප්තියේ 2 වැනි, 3 වැනි, 4 වැනි, 5 වැනි, 6 වැනි, 7 වැනි සහ 9 වැනි වගන්ති අතීතයට බලපෑම.

10. මෙම ප්‍රඥප්තියේ 2 වැනි, 3 වැනි, 4 වැනි, 5 වැනි, 6 වැනි, 7 වැනි සහ 9 වැනි වගන්තීන් මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය 1991 ජනවාරි මස පළමු වැනි දින ක්‍රියාත්මක වූ ලෙස සියළු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

06-444/15